


**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## තිප්පොළේ ශීඝ්‍ර දවසක්

අතම්ට හිඟයි මේ දවස්වල
තිප්පොළේ කාණ්ඩෙට
බමරයක් වගේ කැරකුණත්
ලෝකය
ලක්කල් ගහනවා
දවස එතැන ම

නිමක් නැති සංතාප
ඉබාගාතේ පාවෙන
දෙවැට අයිනට වැදී
ඇම්බුමක් හිනාවෙන්නේ
දවස් ගාණක වෙලේ සිට

සඳ නෑ අමාවකයි
අඳුර දුක නිවනවා සත්තයි
ඇම්බුම ඉගිළුණේ
ගල් බෝතලේ හිලව්වටයි

සෆරින් පැන්නා
බණ්ඩෙ මාමගෙ වත්තට
ගලවගෙන ආවා
මඤ්ඤොක්කා පඳුර තත්පරයට

පාරුක්ගෙ කොටුවෙන්
පැන්නුවෙ කුකුල් නාම්බව
අහුවුණා නම්
සුන්නත් කරනවා චුට්ටව!

හලාල් කරලා හම්සාන්
චිකන් කරි එක හැදුවා
සූරිය සිංහයා
ගල් බෝතලෙන් පැන්නා

කුරාණය වගේ දිග කතාවක්
කියන්නට තිබුණත්
ධම්මපදයක් වගේ ඉක්මනින්
රාත්‍රිය ගෙවුණා

ඔරලෝසු බට්ටන් වගේ
දෙවැටේ හැපිහැපි විත්
මංසලේ දී විසිරුණා

**ටිමිරාන් කීර්ති**
'යන්නං චන්දරේ' කාව්‍ය සංග්‍රහය
- 2014

ඉහත කවිය උදුරා ගත්තේ ටිමිරාන් කීර්තිගේ 'යන්නං චන්දරේ' කවි පොතෙනි. ඒ පොත කියැවූ සැණින්ම මට නම් හිතුණේ, ඔහු කවියටත් වඩා රහට කතන්දර කීමේ රුසියෙක් බවයි. එහි එන ඔහුගේ බොහෝ කවි කතන්දරමය ගුණයෙන් යුක්ත, තරමක් දීර්ඝ රචනා ස්වරූපයක් උසුලා සිටින නිමැවුම්ය. කිසියම් සමාජ වටපිටාවක් පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ඇඳ පෙන්වන්නට ඒ හරහා ඔහු උත්සාහ ගන්නා අතර ඒ තුළින් අපට පෙනෙන්නේ දෛනිකව ඔහු ගැටෙන භෞතික පරිසරයත් ඊටම අනන්‍ය වුණු සමාජයීය පරිසරයත් යන දෙකමය. ඉහත කවිය පවා ලියැවී ඇත්තේ ඒ සමාජ වටපිටාවම ඇසුරු කරගෙන කතන්දරමය රුවකුත් උසුලාගෙනය. නමුත් ඒ කතන්දරය ඇතුළේ සැඟවී ඇති නොකී කතා, අතුරු කථා හෝ පරිකථා කියවා ගන්නට අප කෙරේ ඇති කරන පෙළඹවීම හා බලපෑම සහෘද දැක්ම වඩාත් පුළුල් කරලන්නට සමත් වේ. සරල ගලායන කතන්දරයෙන් ඔබ්බට ගොස් වෙනත් කතාන්දරයක් කියවා ගන්න මේ පොතේ එන බොහෝ කවි ඉඩ සැලසුවද ඇතැම් තැනෙක එය සරල, වත්මන් හෝ අතීතකාමී කතන්දරයක 'කතන්දර රසයෙන්' එහාට නොගොස් නැවතුණ තැන්ද නැතුවා නොවේ.

දැන් අපි කවිය දෙසට හැරෙමු. කියැවූ සැණින් ඕනෑම කෙනෙකුට වැටහෙන සරල කතන්දර ආකෘතියක් හා කතාන්දරයක් ඔබට මේ වචන ඔස්සේ හමුවනු ඇත. එය ගෙතී ඇත්තේ තිප්පොළක දිවිසැරිය වෙනුවෙන් මෙහෙකරන දරිද්‍රතාවයෙන් මිරිකෙන සිහල-මුස්ලිම් තරුණ පිරිසක් වටාය. අත මිට හිඟ දවසක ඔවුනගේ දවසාවසානයේ වෙහෙස මගහරවා ගැනීමට, පයුරු පාසානමකට, එනම් පුංචි පහේ මිතුරු කල්මැරුමකට අවැසි මධුවිතක් වෙනුවෙන් කාරණා කාරණා සැකසෙන අයුරු ඉන් කියැවේ. ඒ සඳහා අවැසිම මත් වතුර වෙනුවෙන් මූල්‍යමය දායකත්වය ලැබෙන්නේ අසල කෙසෙල් පඳුරක අරා වැඩුණ නාඹර කෙසෙල් කැණකිනි. තියෙන තරුණ මදය හා අග හිඟ ඔස්සේම හොරාට කැපෙන ඒ කෙසෙල් කැණෙන් උපයාගත් මුදලින් මධුවිතේ අඩු පාඩුව ලාබ 'ගල් බෝතලයකින්' සැපිරේ. අනතුරුව ඒ මධුවිතට අවැසි අනෙක් අඩු වැඩියද ඒ ආකාරයටම එකිනෙකා විසින් විගසින් සපුරා ගැනෙත්. වත්තකින් හොරාට උගුලා ගත් මඤ්ඤොක්කාද, තව තැනක කුකුල් කොටුවකින් පන්නා ගත් කුකුල් නාම්බකු ගෙන් සැකසෙන මස් කරියද මේ සත් ක්‍රියාවට අවශ්‍ය සියලුම අවුළුපත් හා කටගැස්ම වෙනුවෙන් පෙනී සිටී. අවසානයේ කා බී හමාරව එකම හන්දියකින් වැනි වැනීම ඔවුහු සමුගෙන යති. ඒ මෙහි එන කාටත් පෙනෙන මතුපිට කථාවයි.

දැන් අපි ඒ ඔස්සේ අපට කියවා ගත හැකි අතුරු කථා මොනවා දැයි සොයා පාදා ගන්න උත්සාහ ගමු.

මේ කතාවේ එන සියලු චරිත තිප්පොළේ එදා වේල වෙනුවෙන් කුලියට වැඩකරන දුප්පත් මිනිසුන් බව පළමු කවි කොටසින්ම අපට හැඟෙන්නට ගනී. ඒ ඒ දුප්පත් චරිත මත බඹරය වැල්ලේ කරකැවෙන දවසක් උදාවන පාටක් වත් නැතුවා සේය. නමුත් ලෝකය නම් බඹරයක් සේ ඉතා වේගයෙන් ඔවුන් අබිමුව කරකැවෙමින් ඔවුන් පසුකර යනවා වැනිය. නමුත් ඔවුනගේ දවස අතමිට හිඟකමින් මිරිකෙමින් එකම එක තැනක නතර වූවා සේය. නමුත් වෙහෙසකර දවසක් අවසානයේ ඒ දුක් කරදර මොහොතකට හෝ අමතක කොට යළිත් හෙට දිනයේ අලුත් දවසක් සේ වැඩට එන්නට නම් අද දිනයේ මැරිලාම ඉපදිය යුතුය. ඒ දුෂ්කර කර්කශ ජීවිතය මොහොතකට හෝ නිවා දමන්නට නම් මත් වතුර පොදක ගිලී යන මිතුරු කතා බහක් නම් අවැසිමය. මන්ද, හොඳ සිහියෙන් මේ කටුක තිත්ත ඇත්තට මුහුණදිය නොහැකි බැවිනි. ඒත් ඒ සඳහාත් මුදල් නොමැති නම් මේ දුක්ඛිත ජීවිත වෙනුවෙන් පොඩි හරි සතුටක් වෙනුවෙන්, එනම් තාවකාලික සහනයක් වෙනුවෙන් වෙනත් විකල්පයක් කොහේ හෝ තැනක තිබිය යුතුය. බලාපොරොත්තු සුන්කර ගැනීමෙන් එවැනි මොහොතවල් ගිලිහී යා හැකි බැවින්, හරි හෝ වැරදි හෝ වේවා ඒ ඒ බලාපොරොත්තු වෙනුවෙන් කුමක් හෝ ක්‍රමයක් ඔවුන් විසින් සොයා ගත යුතුව ඇත. නමුත් ඔවුන්ගේ දුක වෙනුවෙන්ම උපන්න වැනි පැසුණු පිරුණු ඇම්බුං කැණක් දෙවැට අයිනේ කෙසෙල් පඳුරකට වී දවස් ගාණක් තිස්සේ ඔවුන් හා හිනැහෙමින් ඉන්නේ මේ වගේ අවස්ථාවක අලුත් අදහසක් සේ හිතට වඩින්නට බලා සිටියා මෙනි. ඒ කෙසෙල් කැණ ගැන ඔත්තුව මේ මිතුරු සංගමයේ එකෙකු සැවොම ඉදිරියේ දිග හරින්නට ඇත්තේ මිතුරුකමේ සහෝදරත්වයේ බැමි ඊටත් වඩා තද බැවින් විය යුතුය. බොහෝ විට මේ කවියේ කථකයා අතින් කෙසෙල් කැණේ වගකීම බාර ගැනෙන්නට ඇත. දවස් ගාණක වෙලේ සිට ඇම්බුං කැණ සිනා සැලූ බව කියන්නේ ඔහුය. ඒ ඔහුගේ මතකයේ සදා නොමැකුණ සිහිවටනයක්ව පහු ගිය දින කිහිපය ඔස්සේ පැසෙමින් තිබී නියමිතම වෙලාවට එනම් අතමිට හිඟම වෙලාවක අලුත් බලාපොරොත්තුවකුත් රැගෙන පුපුරා ගිය සිතිවිල්ලක් බඳුය. මිතුරු කම් නම් එසේමය. හරි වුණත් වැරදි වුණත් හේතු අනවැසිය. අවැසි වන්නේ වැඩේ වන්නය. එතනින් එහාට කවර කතාද?

සඳ නෑ අමාවකයි කියා තෙවැනි කොටසින් තමන්ගේ ජීවිත පිළිබඳම පොඩි සංකේතාර්ථවත් වාක්‍ය කොටසක් ලියා තිබුණද ඒ අඳුරම ඔවුනගේ දුක නිවනවා යැයි කියන කොට මතුවන්නේ වෙනත්ම උත්ප්‍රාසයකි. එය තුන් වන කවියේම අවසාන පේළිවලින් තහවුරු වේ. මෙන්න මේ අමාවක අඳුරම පැසුණු කෙසෙල් කැණ හොරාට කපා ගැනීමට පිඹුරුපත් හා නැකත් සකසන්නේ කාටවත්ම නොපෙනෙන ලෙස ඒ වැඩේ ඉතාම පහසුවට කරගන්නට අවශ්‍ය පසුබිම පවා සකසමිනි. එලෙස හොරාට කපා ගත් කෙසෙල් කැණ 'ගල් බෝතලයක්' වෙනුවෙන් හිලව් වේ. එනම් එය විකුණා ගත් මුදලින් මිතුරු සාදය වෙනුවෙන් අවැසිම මධුවිත සැපිරී හමාරය. ඉතින් මේ දුක නිවන පුංචි ගණුදෙනුකාර සුයාමයට තවත් අඩු පාඩු මොනවාද? ඒ නම් අවුළුපත් කටගැස්ම පමණකි.

මේ වනතුරු මේ මිතුරු පිරිස කොයි වගේ මිතුරු එකතුවක් දැයි කවියේ කිසිම තැනක සඳහනක් නොවුණි. එය විශේෂයෙන් හුවා දක්වා පෙන්වා නොතිබුණි. නමුත් මෙන්න මේ මධුවිත සපුරාගැනීමේ දුෂ්කර මෙහෙයුමේ ඓන්ද්‍රිය සාමාජිකයන් බඳු ඔවුන් හට වෙන වෙනම වෙන්වූ පැනවූ කර්තව්‍යයන් පැවරී තිබුණු අතර එලෙස එකිනෙකාට පැවරී තිබුණු ඒ බාරදූර කාර්යයන් හෙළි කරන තැන ඔවුන්වත් ඉබේටම හෙළි වන්නට ඉඩ හැර තිබුණා විනා මේ මොන වගේ එකතුවක් දැයි කොහේ වත් විශේෂිත ආකාරයකින් කියා නොතිබුණි. එහෙම වුණා නම් මේ කවිය ඒ තරම් නිර්ව්‍යාජ වන්නට නොතිබුණි. එසේ කොට බොරු ව්‍යාජ ජාතීන්-ආගම් අතර වාර්ගික සමගියක් පෙන්නන්න නොයෑමම මේ කවියේ විශේෂිත ලකුණකි. ජාතීන් අතර සමගිය වෙනුවෙන් ලියැවුණ තවත් එක් ව්‍යාජ කවියක් නොවී එවන් වූ මිනිසුන් පිරිසක් වටා අන්‍යෝන්‍යව අවියෝජණීයව බැඳුණු සනාතන දහමක් බඳු දෙයක් ගැන ලියැවුණු මේ කවිය ඒ අරුතෙන්ම එහි නිසග වටිනාකම උසුලා සිටින්නේය. අවසානයේ සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් බුක්ති විඳින්නට සැරසෙන ඒ මිතුරු සංගමයේ එකිනෙකාට පැවරුණු රාජකාරීන් මෙසේ ලඝු කොට දැක්විය හැකිය.



අවුළුපතට අවශ්‍ය මඤ්ඤොක්කා ටික හොරාට ගලවා ගන්නට සිංහල බණ්ඩෙ මාමාගේ වත්තට පනින්නේ මුස්ලිම් සෆරින්ය. ඒ සඳහා ඔහුට තත්පරයක් වත් ගත නොවේ. ඒ මඤ්ඤොක්කා සිංහලද මුස්ලිම්ද කියා ඔවුනට වගක් නැත. මේ කවිය ඇරඹෙන්නේ මෙන්න මෙතැනිනි. එනම් මේ මිතුරු පාත්‍ර වර්ග ගැන, ඔවුනතර වූ බැඳුම් ගැන ඉබේටම කෙරෙන හෙළිදරව්වෙනි. සිහල-මුස්ලිම් කලවමේ සැදුණ මේ මිතුරු ගනු දෙනුව ඇතුළේ ජාතිය වත් ආගම වත් පෙනෙන්නට නැතිවී ඒ මිතුරු බවේ උණුහුමම පමණක් පෙනෙන්නට ගනී. ආගමෙන් තහංචි පැනවී තිබුණද නැතද මේ පයුරුපාසානම මැද හීනියට තැවරෙන මධුවිතකට ජාති භේද හෝ ආගම් භේද නැත. අවුනගේ අඩුපාඩු අඩුම කුඩුම ටික සපයා

46 පිටට